අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

# 2018

# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# Annual Report

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
அரசாங்க அச்சகக் கூட்டுத்தாபனம்
State Printing Corporation

වාර්ෂික වාර්තාව,

ගිණුම් ප්‍රකාශන

සහ

විගණකාධිපතිගේ වාර්තාව

# රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

# 2018

# වාර්ෂික වාර්තාව

2018 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ 51 වෙනි වසර සඳහා

2018 ජනවාරි මස 01 වෙනි දින සිට
2018 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා

මුද්‍රණය : රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

## දැක්ම

මුද්‍රණ කර්මාන්තයේ
ප්‍රමුඛයාවීම සමගින්
ප්‍රකාශනයෙන් විශේෂයෙන්
අධ්‍යාපන සංවර්ධන
ප්‍රකාශනයෙන්,
සුරක්ෂා මුද්‍රණ කර්මාන්තය,
අභ්‍යාස පොත් හා ලිපිද්‍රව්‍ය
නිෂ්පාදන වෙළඳපොළේ
පුරෝගාමියා වීම.

## මෙහෙවර

දක්ෂ, නිපුණ, ධෛර්යමත්
හා තෘප්තිමත්
සේවක මණ්ඩලයකින් සමන්විත
ආදර්ශමත් රාජ්‍ය සංස්ථාවක්
ලෙස මුද්‍රණ කර්මාන්තයේ
උසස්ම ප්‍රමිතියට අනුව
තරඟකාරී මිලකට
මුද්‍රිත නිෂ්පාදන
ජනතාවගේ අවශ්‍යතාවය හා
උන්නතිය සඳහා
සැපයීමට කැපවෙනු ඇත.

පානළුව,
පාදුක්ක.

ගරු අධ්‍යාපන අමාත්‍යතුමා
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය
බත්තරමුල්ල.

ගරු ඇමතිතුමනි,

1971 අංක 38 දරන මුදල් පනතේ 14 වෙනි වගන්තියේ කොන්දේසිවලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2018 දෙසැම්බර් 31 දින දක්වා වූ කාල පරිච්ඡේදය ආවරණය කෙරෙන,

01. රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාව
02. ගණන් පරීක්ෂණයට භාජනය කරන ලද මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය හා විස්තීරණ ආදායම් ප්‍රකාශය ඇතුළු මූල්‍ය ප්‍රකාශන
03. විගණකාධිපතිවරයාගේ අදහස් දැක්වීම

ඔබතුමාගේ දැන ගැනීම සඳහා මේ සමග ඉදිරිපත් කරමි.

මෙයට - විශ්වාසී
**ජනක රත්නකුමාර**
සභාපති
රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව



# සභාපතිතුමාගේ පණිවිඩය

**රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ අභිනව සභාපතිවරයා ලෙස, පසුගිය වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව සඳහා පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම, භාග්‍යයක් කොට මා සලකන්නෙමි.**

1968 අංක 24 දරන පනත ප්‍රකාරව, 1968 වර්ෂයේ ආරම්භ කරන ලද රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, පුරා 52 වසරක් මුළුල්ලේ රාජ්‍ය මුද්‍රණ ක්ෂේත්‍රය තුළ අඛණ්ඩව විරාජමාන වීම, ආයතනයට නවකයෙකු වූ මටත්, දිගු කාලීන සාමාජිකයන් වූ ඔබ සැමටත් ඉමහත් සතුටක් දනවන කරුණකි.


ශ්‍රී ලංකා ජනරජයේ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවත්නා රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, ශ්‍රී ලාංකීය ශිෂ්‍ය ප්‍රජාව සඳහා පාසල් පෙළපොත් ද, සෘජු වෙළඳ නාම යටතේ අභ්‍යාස පොත් ද, රජයේ නිල ලේඛන සහ ලිපි ද්‍රව්‍ය මුද්‍රණය කිරීම මෙන්ම, ආරක්ෂිත මුද්‍රණ කටයුතු ද සිදු කිරීමෙන් රටට සහ ජාතියට සිදු කරන්නේ අනුපමේය මෙහෙවරකි.

මූල්‍යමය වශයෙන් පාඩු ලබන රාජ්‍ය ආයතන, නැවතත් ලාභ ලබන තත්වයට පත් කිරීම අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන්ගේ උදාර අරමුණකි. ඒ අනුව යමින්, ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමන්ගේ ආශීර්වාදයත්, ගරු අධ්‍යාපන අමාත්‍ය ඩලස් අලහප්පෙරුම මැතිතුමන්ගේ උපදෙස්, මග පෙන්වීම හා සහයෝගයත් සහ ගරු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය රංජිත් සියඹලාපිටිය මැතිතුමාගේ අධීක්ෂණයත් ඇතිව, අභිනවයෙන් පත්වූ සභාපතිවරයා ලෙස, උක්ත අරමුණ හැකි පමණින් යථාර්ථයක් බවට පත්කිරීම, මාගේ ඒකායන අධිෂ්ඨානය වේ.

ආයතනයේ සහ එහි සාමාජිකයන්ගේ මානව ඵලදායීතා ප්‍රවර්ධනයත්, ජාත්‍යන්තර වශයෙන් ද පිළිගෙන ඇති පරිසර හිතකාමී වටපිටාවක් ඇති කරවන නූතන හරිත සංකල්පයත්, මේ ආයතනය තුළ ස්ථාපිත කිරීමේ අවශ්‍යතාව, වැදගත්කම සහ වටිනාකම මා හොඳින් අවබෝධ කොටගෙන ඇත්තෙමි. නවීන ව්‍යාපාරික ලෝකයේ ප්‍රබලතම අංගයක් වන තොරතුරු තාක්ෂණ විෂයය සංස්ථාවේ කටයුතු සඳහා සම්බන්ධ කරගැනීමත්, ආයතනය - ඔබ සැමට තවදුරටත් කාර්යක්ෂම සහ ප්‍රියමනාප සේවා ස්ථානයක් බවට පත් කිරීමත්, දියුණුවන කාර්මික තාක්ෂණය අප ආයතනයට ගැළපෙන පරිදි උපයෝගී කර ගැනීමත්, අනිවාර්යයෙන් සිදුවිය යුත්තක් බව, ආයතනයට සම්බන්ධවූ කෙටිකාලය තුළ මා අවබෝධ කොටගෙන ඇත. ඒ අනුව යමින් ආයතනය සතුව ඇති මානව සම්පත් පුහුණුකර, සංස්ථාවේ පැවැත්ම ස්ථාවර කිරීමේ අරමුණැතිව සාධාරණ ලාභයක් ලබමින්, ආයතනයේ මූල්‍ය ශක්තිය වර්ධනය කිරීම මාගේ ප්‍රධානතම බලාපොරොත්තුවකි. ඒ ඔස්සේ මෙහි සේවය කරන විශාල සාමාජික සංඛ්‍යාවකගේ සුභසාධනය දියුණු කිරීම සහ අප විසින් පුරෝකථනය කරගනු ලබන ඉලක්ක, අභියෝග සහ අරමුණු ජයගැනීමේ වගකීම සභාපතිවරයා ලෙස මම භාරගන්නෙමි. මේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස කාර්යමණ්ඩල සාමාජික සාමාජිකාවන් වූ ඔබට ද විශාල වගකීමක් සහ යුතුකමක් ඇති බව මෙහිදී මතක් කිරීමට මා කැමැත්තෙමි.

තිරසාර සංවර්ධනය යන තේමාව අරමුණු කර ගනිමින්, සියලුම කාර්යමණ්ඩල සාමාජික සාමාජිකාවන් ඉදිරිපත් කරන ධනාත්මක අදහස්, යෝජනා සහ සංකල්ප සලකා බලමින් සහ ඒවා ක්‍රියාත්මක කරමින් ආර්ථික, පාරිසරික හා සමාජීය සංවර්ධනය යන උදාර සංකල්ප ත්‍රිත්වයේ සම්මිශ්‍රණය මත, මේ ආයතනය ශ්‍රී ලංකාවේ මුද්‍රණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා බවට පත්කරවීමත්, ඉන් ලැබෙන ගෞරවය, අභිමානය සහ කීර්තිය එම සද් කාර්යයට දායකවන ඔබ සැමවෙත ලබාදීමත්, සභාපතිවරයා ලෙස මාගේ ඒකායන අරමුණ සහ බලාපොරොත්තුව වේ.

**එක්වෙමු, ඉටු කරමු, සතුටු වෙමු.**



**ජනක රත්නකුමාර**
සභාපති
රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

# 2018

# අධ්‍යක්ෂ මණ්ඩලය

**සභාපති**

එස්. ආලෝක බණ්ඩාර මහතා (2017. 12. 18 - 2018. 05. 24)

එස්. ඒ. බිනර ජයවර්ධන මහතා (2018. 05. 24 - 2018. 10. 26)

**ක්‍රියාකාරී අධ්‍යක්ෂ**

බන්දුල ඩයස් මහතා (2017. 06. 29 - 2018. 03. 19)

පී. එම්. පියදාස මහතා (2018. 03. 19 - 2018. 05. 21)

මහින්ද පුෂ්පකුමාර මහතා (2018. 05. 21 - 2018. 10. 26)

**අධ්‍යක්ෂ**

1. නාලිකා එදිරිසිංහ මිය
2. නහිල් හපුආරච්චි මහතා
3. ජී. එම්. නීල් ගුණදාස මහතා
4. රෝහණ රත්නායක මහතා
5. ජේ. ආර්. ඩී. ජයතිලක මහතා
6. එම්. එම්. පී. කේ. මීගහකොටුව මිය
7. පද්මිණී නාලිකා මිය
8. ඩබ්. ඒ. විජයානන්ද මහතා

# 2018

## විධායක නිලධාරී මණ්ඩලය

**සාමාන්‍යාධිකාරී**
ආර්. එම්. එන්. මොණරවිල මහතා

**මුදල් කළමනාකරු**
එන්. ඩී. ප්‍රියංකර කුමාර මහතා

**වැඩ කළමනාකරු**
එස්. ටී. කරුණාරත්න මහතා

**සැපයුම් කළමනාකරු**
ඊ. වී. කේ. කීර්තිරත්න මහතා

**කළමනාකරු (පරිපාලන හා මානව සම්පත් සංවර්ධන)**
ආර්. එම්. යූ. ඩී. බණ්ඩාර මහතා

**අලෙවි කළමනාකරු**
එම්. ටී. ජේ. පෙරේරා මහතා

**නියෝජ්‍ය වැඩ කළමනාකරු**
ඩී. එම්. එම්. බී. දිසානායක මහතා

**නියෝජ්‍ය වැඩ කළමනාකරු**
ටී. එම්. ආර්. එන්. තෙන්නකෝන් මහතා

**නියෝජ්‍ය මුදල් කළමනාකරු**
කේ. එච්. තිලකරත්න මහතා

**කළමනාකරු (ලිපි ද්‍රව්‍ය කර්මාන්ත ශාලාව)**
එල්. ටී. ප්‍රේමසිරි මහතා

**ගණකාධිකාරී**
එම්. ආර්. පී. ජයවර්ධන මහතා

**ගණකාධිකාරී**
ඩබ්. එල්. දෙනියගේ මහතා

**අභ්‍යන්තර විගණක**
එම්. එස්. එස්. මොහොට්ටි මහතා

**සහකාර කළමනාකරු වැඩ (ඇස්තමේන්තු)**
කේ. ඩී. ටී. චන්ද්‍රසිරි මහතා

**සහකාර කළමනාකරු වැඩ (සුරක්‍ෂා)**
එම්. ඒ. කොතලාවල මහතා

**සහකාර කළමනාකරු වැඩ (ප්‍රොසෙස්)**
එස්. ඩී. කුමාරසිංහ මහතා

**සහකාර කළමනාකරු වැඩ (පොත් බැඳීම්)**
එම්. ඒ. ශාන්ත කුමාර මහතා

**සහකාර කළමනාකරු වැඩ (ලිතෝ)**
පී. කේ. තිලක් මහින්ද මහතා

**සහකාර කළමනාකරු (විකුණුම්)**
එච්. ආර්. ගුණසේකර මහතා

**සහකාර කළමනාකරු (ආරක්‍ෂක)**
ඩබ්. ඩබ්. එම්. ආරච්චිගේ මහතා

**සහකාර කළමනාකරු**
**(පරිපාලන හා මානව සම්පත් සංවර්ධන)**
කේ. එච්. බී. සජීව මහතා

**සහකාර කළමනාකරු**
**(නීති/අධ්‍යක්‍ෂ මණ්ඩල ලේකම්)**
ඒ. එල්. ආර්. මධුකානි මහත්මිය

**සහකාර කළමනාකරු (ප්‍රකාශන)**
මධුරංග සී. නුවන්ප්‍රිය මහතා

**සහකාර කළමනාකරු (සැපයුම්)**
යූ. අනිල් ජයකාන්ත මහතා

**ගණකාධිකාරී**
ඩබ්. ඒ. ඒ. එස්. ජයසුන්දර මහතා

**සහකාර කළමනාකරු වැඩ (නඩත්තු)**
එන්. ජී. එල්. චන්දිමාල් මහතා

# 2018

## රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

1971 අංක 38 දරන මුදල් පනතේ 14 වන වගන්තියේ කොන්දේසි ප්‍රකාරව 2018 දෙසැම්බර් 31 වෙනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සංස්ථාවේ ක්‍රියාත්මක වූ වැඩ පිළිවෙළ ඇතුළත් සිය 50 වෙනි වාර්තාව රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය සතුටින් මෙසේ ඉදිරිපත් කරයි.


සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් 11 ක් පවත්වන ලදී.

## 01. නිෂ්පාදනය

### 1.1 පාසල් පෙළ පොත්


### 1.1.1 පාසල් පෙළ පොත් මුද්‍රණය

පාසල් පෙළ පොත් මුද්‍රණය මූලික අරමුණ කර ගනිමින් පිහිටුවනු ලැබූ සංස්ථාව විවෘත ආර්ථිකය හඳුන්වා දීමත් සමගම වෙනත් නිෂ්පාදන අංශ කරා යොමුවී ඇත. ඒ සමගම පාසල් පොත් මුද්‍රණය සෘජුව සංස්ථාව වෙත පැවරීම වෙනුවට ටෙන්ඩර් මගින් තරගකාරීව අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ ඇණවුම් ලබා ගැනීමට සංස්ථාවට සිදුවිය. එහෙත් එම ක්‍රමය වෙනස් කරමින් 2018 වර්ෂයේදී ද ටෙන්ඩර් පටිපාටියෙන් පරිබාහිරව පෙළ පොත් මුද්‍රණය සංස්ථාවට පැවරීමට කැබිනට් අනුමැතිය ලැබිණි. ඒ අනුව 2018 වසරේ දී ද පාසල් පෙළ පොත් පිටපත් මිලියන 4.485 ක් මුද්‍රණය කර දෙමින් සංස්ථාවට රුපියල් මිලියන 428.627 ක ආදායමක් ලැබුණි.




සමාලෝචිත වර්ෂයේ මුද්‍රණය කළ පාසල් පෙළ පොත් පිටපත් සංඛ්‍යාව හා ඉන් ලද ආදායම 2016 හා 2017 ට සාපේක්ෂව පහත දැක්වේ.

| පාසල් මුද්‍රණ වැඩ | 2016 ('000) | 2017 ('000) | 2018 ('000) |
|---|---|---|---|
| පිටපත් සංඛ්‍යාව | 10,984 | 7,981 | 4,485 |
| ආදායම - රු. | 855,865 | 676,391 | 428,627 |





### 1.2 වෙනත් මුද්‍රණ සේවා


සමාලෝචිත වර්ෂය තුළදී දහම් පාසල් පොත් මුද්‍රණය, ආරක්ෂිත මුද්‍රණ සේවා (ලොතරැයිපත්, රිදී රේඛා, බැංකු තැන්පත් සහතික පත්, තැපැල් පාස්පොත්, ලේබල්, එයාපෝර්ට් සුපර් ඩ්‍රෝ යනාදිය) සහ රාජ්‍ය ආයතන සඳහා මුද්‍රණ සේවා සපයන ලදී. එමෙන්ම විවිධ ආයතන සඳහා දිනපොත්, කැලැන්ඩර් යනාදිය මුද්‍රණය කරන ලදී. මීට අමතරව විවිධ ආයතනවල මුද්‍රණ කාර්යයන් ද ඉටු කරන ලදී. විශේෂ මුද්‍රණ සේවා කිහිපයක් පහත පරිදි වේ.

### 1.2.1 සුරක්ෂා මුද්‍රණ සේවා

ජාතික ලොතරැයි මණ්ඩලය සඳහා මහජන සම්පත ලොතරැයිය දිනට වසර 44 ක පමණ කාලයක් මුද්‍රණය කරන ලදී. මීට අමතරව එයාපෝර්ට් ලොතරැයිය ද මුද්‍රණය කරනු ලැබේ. ලොතරැයි මණ්ඩලයෙන් ලද සියලුම ඇණවුම් මුද්‍රණය කර දුන් අතර, 2018 වසරේ දී මුද්‍රණය වූ ලොතරැයි ප්‍රමාණය මිලියන 428 කි. ඒ අනුව ආදායම රු. මිලියන 249ක් වී ඇත. ලොතරැයි මුද්‍රණයේ ආදායම හා පිටපත් සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.




| ලොතරැයි මුද්‍රණ වැඩ | 2016 ('000) | 2017 ('000) | 2018 ('000) |
|---|---|---|---|
| පිටපත් සංඛ්‍යාව | 428,902 | 399,739 | 427,415 |
| ආදායම - රු. | 245,060 | 233,947 | 248,011 |




### 1.2.2 වෙනත් මුද්‍රණ සේවා

රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සඳහා මෙන්ම පෞද්ගලික අංශයේ ඇණවුම් ලබා ගැනීම කෙරෙහි විශේෂ උනන්දුවකින් ක්‍රියා කරන ලදී. ඉටු කරන ලද විශේෂ මුද්‍රණ සේවා අතර පහත සඳහන් සේවා ප්‍රධාන තැනක් ගන්නා ලදී.


01. විවිධ ආයතනයන් සඳහා වූ වාර්ෂික වාර්තා
02. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සඳහා වූ විවිධ මුද්‍රණ වැඩ
03. විශ්වවිද්‍යාල සහතික පත්
04. ජාතික සත්වෝද්‍යානයට අයත් ප්‍රවේශ පත්‍ර හා අනෙකුත් විස්තර පත්‍රිකා
05. සිනමාශාලා ටිකට්පත්
06. සේවක අර්ථසාධක අරමුදලේ විවිධ මුද්‍රණ වැඩ
07. ජාතික ඉතිරි කිරීමේ බැංකුවට අයත් මුද්‍රණ කටයුතු
08. විභාග දෙපාර්තමේන්තුව සඳහා මුද්‍රණය කරන ලද උත්තර ලියන කඩදාසි පොත්
09. දහම් පාසල් පොත් මුද්‍රණය

සමාලෝචිත වර්ෂයේදී විවිධ මුද්‍රණ වැඩ ඉටු කරමින් සංස්ථාව ලත් ආදායම රු. මිලියන 154 කි.

## 1.3 අභ්‍යාස පොත් සහ අනෙකුත් පොත් නිෂ්පාදනය

සමාලෝචිත වසරේදී නිෂ්පාදනය පහත පරිදි වේ.

| විස්තරය | නිෂ්පාදන ප්‍රමාණය | වටිනාකම (රුපියල්) |
|---|---|---|
| අභ්‍යාස පොත් (පිටු 80 පොත් වලින්) | මිලියන 5.769 | මිලියන 143,021 |
| සී. ආර්. පොත් (පිටු 80 සී.ආර්. පොත් වලින්) | මිලියන 0.877 | මිලියන 46,013 |
| වෙනත් ලිපිද්‍රව්‍ය නිෂ්පාදන (ඒකක වලින්) | මිලියන 0.574 | මිලියන 49,299 |
| එකතුව | මිලියන 7.220 | මිලියන 238,333 |





සමාලෝචිත වර්ෂයේදී ලිපිද්‍රව්‍ය අංශයේ නිෂ්පාදනය 2016 හා 2017 වසරවලට සාපේක්ෂව පහත පරිදි වේ.

| අභ්‍යාස පොත් හා අනෙකුත් පොත් | 2016 ('000) | 2017 ('000) | 2018 ('000) |
|---|---|---|---|
| පොත් පිටපත් සංඛ්‍යාව | 9,869 | 10,785 | 7,220 |
| ආදායම - රු. | 233,973 | 279,680 | 238,333 |


අපේක්ෂිත පරිදි ලියන කඩදාසි තොග සැප්තැම්බර් සිට දෙසැම්බර් කාල පරාසය තුල නොලැබීම නිසා 2018 වර්ෂයේ අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීමට නොහැකි විය.

2018 වසරේ නිෂ්පාදන ඉලක්කය : මිලියන 12,12
(වටිනාකම රු. මිලියන 327)




## 02. අලෙවි හා විකුණුම්

| වර්ෂය | 2016 රු. | 2017 රු. | 2018 රු. |
|---|---|---|---|
| සමස්ත ආදායම (බදු ඇතුළත්) | 297,745,747.00 | 286,849,475.00 | 282,021,852.00 |




2018 වර්ෂයේදී සමස්ත අලෙවි ආදායම සුළු වශයෙන් අඩුවීමක් සිදු වී ඇත.

2016 වසරට සාපේක්ෂව 2017 වසරේදී අභ්‍යාස පොත් ආදායමෙහි අඩුවීමේ ප්‍රතිශතය 2018 වර්ෂයේ අඩුවීමේ ප්‍රතිශතය වූ 3.7% ප්‍රමාණය 2018 වර්ෂයේදී 1.39% දක්වා පහත වැටී ඇත. ආදායම් අඩුවීමට ප්‍රධාන හේතුව ලෙස 2018 වර්ෂයේ පොත් නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය සැපයීමේ හිඟය නිසා නිෂ්පාදනය පහත වැටීමයි.

ඊට අතිරේකව බාහිර ආයතන මගින් මිලට ගෙන නැවත අලෙවි කිරීමට යොදා ගන්නා ලිපිද්‍රව්‍ය අයිතමයන් 2018 වර්ෂය තුළ අපේක්ෂිත පරිදි සපයා ගැනීමට නොහැකි වීම අපේක්ෂිත ආදායම් අඩුවීමට හේතු වී ඇත.

සංස්ථා නිෂ්පාදනයෙන් සහ බාහිර ලිපිද්‍රව්‍ය අයිතමයන් අපේක්ෂිත පරිදි සම්පූර්ණ කිරීමේ හැකියාව පැවතියේ නම් එම වර්ෂය තුළ ආදායම තවදුරටත් 20% - 25% අතර ප්‍රමාණයකින් ඉහළ නංවා ගැනීමේ හැකියාව පැවතිණි.

## ප්‍රකාශන සේවා

ප්‍රකාශන අංශය සඳහා ප්‍රකාශන කළමනාකරුවෙකු හා ඊට සහායක සේවක අවශ්‍යතාවයද සපයා දී ඇත.

ප්‍රකාශන අංශයේ ආදායම් ඉහළ නැංවීමේ අරමුණෙන් අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන ව්‍යාපෘතිය ආරම්භ කර තිබේ. ඊට සමගාමීව නවකතා හා ළමා කතාපොත් ප්‍රකාශන ව්‍යාපෘතිය ද ක්‍රියාත්මකය.

| | |
|---|---|
| 2018 ප්‍රකාශිත නව කෘති ගණන | 13 |
| මුද්‍රිත මුළු පිටපත් ගණන | 21,285 |
| 2017 ලද ප්‍රකාශන ආදායම | රු. 3,202,535.00 |
| 2018 ලද ප්‍රකාශන ආදායම | රු. 5,200,169.80 |

මෙම ක්ෂේත්‍රයේ පෙර වසරේ ලැබූ ආදායම් වටිනාකම සැලකීමේදී සමාලෝචිත වර්ෂයේදී ඊට පෙර වර්ෂයට වඩා රු. 1,997,634.80 ක පමණ අලෙවියක් පෙන්නුම් කරයි.

එසේම, දැනට වඩා ආදායම් ඉහළ නැංවිය හැකි ක්‍රමවේදයක් පිළිබඳව ඉදිරියේදී අවධානය යොමු කළ යුතුව ඇත.

## 03. ස්ථාවර වත්කම්

2018 වර්ෂය අවසානයේදී සංස්ථාව සතු ස්ථාවර වත්කම්වල මුළු පිරිවැය රු. 1,155,212,071/- ක් විය. එහි ශුද්ධ වටිනාකම රු. 1,039,094,309/- කි. මෙම තත්ත්වය මීට පෙර එනම් 2017 වසර හා සැසඳීමේදී පිළිවෙළින් රු. 1,148,392,769 ක් හා රු. 1,093,382,090/- ක් වශයෙන් විය.

| ස්ථාවර වත්කම් | 2016 රු.('000) | 2017 රු.('000) | 2018 රු.('000) |
|---|---|---|---|
| ආරම්භක වටිනාකම (පිරිවැයට) | 397,198 | 872,653 | 1,148,393 |
| වර්ෂ අවසාන ශුද්ධ වටිනාකම | 147,377 | 1,093,382 | 1,039,094 |

## 04. බදු බැඳියාව

සංස්ථාව තක්සේරු වර්ෂ 2017/2018 සඳහා ආදායම් බදු හා ලාභාංශ බදු ලෙස කිසියම් හෝ මුදලක් සංස්ථාවේ 2018 වසරේ අවසාන ගිණුම් අනුව ප්‍රතිපාදනය කොට නොමැත.


| බදු බැඳියාව | 2016 රු. ('000) | 2017 රු. ('000) | 2018 රු. ('000) |
|---|---|---|---|
| ආදායම් බදු | 324 | - | - |
| ලාභාංශ බදු | - | - | - |
| එකතුව | 324 | - | - |

## 05. ලාභය

2018 වසර තුළදී සංස්ථාව රු. 406,985,154/- ක බදු පූර්ව අලාභයක් උපයා ඇති අතර, 2017 වසරේදී රු. 243,094,833/- ක අලාභයක් විය.

| ලාභදායිතාව | 2016 රු. ('000) | 2017 රු. ('000) | 2018 රු. ('000) |
|---|---|---|---|
| බදු පූර්ව ලාභය | (74,650) | (243,094) | (406,985) |
| බදු ප්‍රතිපාදනයෙන් පසු | (74,974) | (243,094) | (406,985) |


2017 වාර්ෂික වාර්තාවේ දක්වන ලද ලාභය හා බදු බැඳියාව 2017 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ නිරීක්ෂණ අනුව 2018 වර්ෂයේ නැවත ගිණුම් සකස් කිරීමේදී ඉහත ආකාරයට සංශෝධනය වී ඇත.



## 06. ප්‍රසාද දීමනා

2017 වසරේදී රු. 50,190,854 ප්‍රසාද දීමනාවක් සියලු සේවකයින්ගේ මාස 02 ක වැටුපකට සමානව ගෙවීම් කළද, 2018 වර්ෂයේ අලාභය රුපියල් මිලියන 407 ක් වූ බැවින් සුපුරුදු ලෙස ප්‍රසාද දීමනා ගෙවීමට නොහැකි විය.

| ප්‍රසාද දීමනා | 2016 රු. ('000) | 2017 රු. ('000) | 2018 රු. ('000) |
|---|---|---|---|
| | 53,029 | 50,191 | 1,408 |




## 07. සුභ සාධනය

පහත සඳහන් සුභ සාධන සේවා හා පහසුකම් පසුගිය වර්ෂයේ පදනම යටතේ මෙම වසර තුළදී ද පවත්වා ගෙන යන ලදි. මේ වෙනුවෙන් සංස්ථාව වැය කළ මුළු මුදල රුපියල් මිලියන 69.8 ක් විය.

| | සුභ සාධනය | 2016 රු.('000) | 2017 රු.('000) | 2018 රු.('000) |
|---|---|---|---|---|
| 01. | සේවක ප්‍රවාහන පහසුකම් | 4,877 | 11,012 | 10,879 |
| 02. | සේවක දිරි දීමනා ගෙවීම් | 6,075 | 6,020 | 5,263 |
| 03. | වෛද්‍යාධාර ප්‍රතිලාභ ගෙවීම | 9,655 | 10,612 | 10,046 |
| 04. | සේවක විවිධ සුභ සාධනය | 25,246 | 24,924 | 24,297 |
| 05. | කම්කරු වන්දි ආරක්ෂණය | - | - | - |
| 06. | සියලුම සේවකයින් සඳහා ලිපිද්‍රව්‍ය තෑගි වවුචරයක් ප්‍රදානය කිරීම | 1,646 | 1,685 | 1,703 |
| 07. | සේවක ප්‍රසාද දීමනා | 53,029 | 50,191 | 1,408 |
| 08. | සේවක නිවාස ණය ප්‍රතිපූරණය | 4,274 | 3,114 | 2,573 |
| 09. | සේවක ඉතිරි නිවාඩු සඳහා ගෙවීම | 16,409 | 15,607 | 13,615 |
| 10. | විශේෂ දිරි දීමනා | 6,630 | 7,490 | - |
| | **එකතුව** | **127,841** | **130,657** | **69,748** |

## 08. සේවක මණ්ඩලය

2018. 12. 31 දිනට සංස්ථාවේ සේවක සංඛ්‍යාව 648 කි.

| **සේවක සංඛ්‍යාව** | **2018** |
|---|---|
| කාර්යාලය | 134 |
| ප්‍රධාන මුද්‍රණාලය | 324 |
| ලිපිද්‍රව්‍ය කම්හල | 59 |
| ආරක්ෂක අංශය | 41 |
| අලෙවිසැල් | 38 |
| කොන්ත්‍රාත් සේවකයින් | 52 |
| **මුළු සේවක සංඛ්‍යාව** | **648** |

### 2018 වර්ෂය තුළ දී සේවයට බඳවාගෙන ඇති නිලධාරීන්

2018 වර්ෂය තුළදී සංස්ථාවට නිලධාරී මට්ටමේ සේවක මහත්ම මහත්මීන් කිසිවකු බඳවාගෙන නොමැත.

### 2018 වර්ෂය තුළ දී සේවයෙන් ඉවත් වූ නිලධාරීන්

| | නම/තනතුර | දිනය |
|---|---|---|
| 1. | එම්. ඒ. ශාන්ත කුමාර මහතා<br>- සහකාර කළමනාකරු වැඩ (පොත් බැඳීම්) | 2018. 03. 01 |
| 02. | ඩී. එම්. එම්. බී. දිසානායක මහතා<br>- නියෝජ්‍ය වැඩ කළමනාකරු | 2018. 04. 07 |
| 03. | ආර්. එම්. යූ. ඩී. බණ්ඩාර මහතා - කළමනාකරු<br>(පරිපාලන හා මානව සම්පත් සංවර්ධන) | 2018. 11. 01 |

## සමාප්තිය

සංස්ථාවේ වැඩ කටයුතු ඉතා සාර්ථක ලෙස කර ගෙන යාම සඳහා ඉතා ලැදිව සහයෝගය දුන් සංස්ථාවේ සියලු සේවකයන්ට සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තුතිය පිරිනැමේ. සාර්ථක වැඩ පිළිවෙළක් සඳහා සෑම විටම මග පෙන්වීම කරමින් සහාය ලබාදුන් ගරු අධ්‍යාපන අමාත්‍යතුමාටත්, එම වැඩ පිළිවෙළට නිරතුරුව සහයෝගය ලබාදුන් අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තුතිය පිරිනැමේ.

ඉදිරි වර්ෂය තුළදී ද එවැනිම සහයෝගයක් හා ප්‍රතිචාරයක් සංස්ථාවේ සියලු සේවකයින්ගෙන් පාලනාධිකාරිය බලාපොරොත්තු වන්නේය.

**ජනක රත්නකුමාර**
සභාපති

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්
## 2018 දෙසැම්බර් 31 වැනිදා වන විට

## 1. සංස්ථාව පිළිබඳ තොරතුරු

### 1.1 වාර්තාකරණ ආයතනය

1968 අංක 24 දරන පාර්ලිමේන්තු පනතට අනුව රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව 1968 වසරේදී ස්ථාපනය කෙරිණි. ආයතනික අධ්‍යක්ෂ මණ්ඩලය එහි කළමනාකාරීත්වය භාරව ක්‍රියා කරයි.
පාදුක්ක, පානළුව ප්‍රදේශයේ මෙය පිහිටා තිබේ.

### 1.2 ප්‍රධාන කාර්යයන් හා මෙහෙයුම්වල ස්වභාවය

සංස්ථාවේ ප්‍රධාන කාර්යයන් වන්නේ පාසල් පෙළ පොත් මුද්‍රණය, අභ්‍යාස පොත් නිෂ්පාදනය හා වෙනත් මුද්‍රණ කාර්යයන් සිදු කිරීමයි.

### 1.3 නිකුත් කිරීමට අධිකාරය ලද දිනය

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ 2018.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන 2019. 02. 25 දින අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් නිකුත් කිරීමට අනුමත කරන ලදී.

## 2. ගිණුම් ප්‍රමිතීන් හා පිළියෙල කිරීමේ පදනම

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, ආදායම් පිළිබඳ පුළුල් ප්‍රකාශනය, අරමුදල් හා මුදල් ගලා ඒමේ වෙනස්කම් සහ ප්‍රතිපත්ති මෙන්ම සටහන් සකසා ඇත්තේ LKAS සහ SLFRS යන ගිණුම්කරණ ප්‍රමිතීන් හා 1971 අංක 38 දරන මූල්‍ය පනතට අනුවය.

### 2.1 අනුකූලතා ප්‍රකාශය

උපචිත පදනම හා ඓතිහාසික පිරිවැය පදනම් කර ගනිමින් මූල්‍ය ප්‍රකාශනය සකසා තිබේ. ශ්‍රී ලංකා රුපියල්වලින් එය ඉදිරිපත් කර ඇත.

### 2.2 ඇගයුම් පදනම

පහත සඳහන් කරුණු හැර මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කර තිබෙන්නේ ඓතිහාසික පිරිවැය පදනම් කර ගෙනය.

* විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සඳහන් පොලී ආදායම
* ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම්

### 2.3 අඛණ්ඩ පැවැත්ම

සංස්ථාව පවත්වා ගෙන යාමට ඇති හැකියාව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය තක්සේරුවක් සිදු කොට අවධානය යොමු කර ඇත. කෙසේ වෙතත් එය ඇවර කිරීමට හෝ මෙහෙයුම් නතර කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අපේක්ෂා නොකරයි.

### 2.4 භාවිතාවන ව්‍යවහාර මුදල්

අවසාන ගිණුම් ඉදිරිපත් කර ඇත්තේ සංස්ථාවේ ව්‍යවහාර මුදල් වූ ශ්‍රී ලංකා රුපියල්වලිනි.
සියලුම මූල්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇත්තේ රුපියල්වලින් වන අතර ආසන්න රුපියලේ අගයට වටිනාකම් දක්වා ඇත.

### 2.5 සංසන්දනාත්මක තොරතුරු

සංස්ථාව විසින් කලින් අවුරුදු වල අනුගමනය කළ ගිණුම් ප්‍රතිපත්තීන් නොවෙනස්ව ඒ ආකාරයෙන් අනුගමනය කර ඇත. අවශ්‍ය අවස්ථාවල කලින් අවුරුදුවල වටිනාකම් හා සඳහන් කිරීම් නැවත සකසා ඉදිරිපත් කිරීම් කර ඇත. සංස්ථාව විසින් ඉකුත් වර්ෂවලට අදාළ වැරදි නිවැරදි කිරීම් අතීතානුයෝගීව ගළපා ඉකුත් වර්ෂයේ මූල්‍ය තත්වය නැවත ප්‍රකාශ කර ඇත.

## 3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

පහත සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සියලුම කාලපරිච්ඡේදයන් සඳහා ඒකාකාරී ලෙස නොකඩවා සංස්ථාව විසින් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇත.

### 3.1 දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ සඳහන් කර ඇත්තේ එකතු ක්ෂයවීම් අඩු කරන ලද ශුද්ධ පිරිවැය හෝ ප්‍රත්‍යාගණන වටිනාකම වේ.

පහත සඳහන් දිනවල තක්සේරු දෙපාර්තමේන්තුව විසින් වත්කම් තක්සේරු කරන ලදී.

| | |
|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | - 02. 01. 2017 සිට 06. 01. 2017 දක්වා |
| කාර්යාලයීය උපකරණ<br>ලී බඩු හා සවිකිරීම්<br>පරිගණක උපාංග | - 02. 01. 2017 සිට 30. 01. 2017 දක්වා |
| යන්ත්‍ර හා පිරියත | - 16. 01. 2017 සිට 30. 01. 2017 දක්වා |
| මෝටර් රථවාහන | - 13. 01. 2016 සිට 14. 01. 2016 දක්වා |

වත්කම් ප්‍රත්‍යාගණනයේ වෙනස හෝ ලාභය විස්තීරණ ආදායම තුළ දක්වා ඇති අතර හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය තුළ ප්‍රත්‍යාගණන සංචිතය නමින් ප්‍රත්‍යාගණන ලාභය දක්වා ඇත.
වත්කම් ප්‍රත්‍යාගණනයෙන් පසු කාර්යාලීය උපකරණ සහ ලී බඩු හා සවිකිරීම් එකම පංතියක් ලෙසත් උපකරණ මෙවලම් සහ අත් කරත්ත තවත් පංතියක් ලෙසත් වර්ගීකරණය කර ඉදිරිපත් කර ඇත.

#### 3.1.1 ක්ෂයවීම්

දේපළ, පිරියත සහ උපකරණවල ඵලදායී ජීවකාලය පිළිබඳ තක්සේරුවකින් පසු සරල මාර්ග ක්‍රමයට ක්ෂය වීම් ගණනය කරනු ලැබේ.

**තක්සේරු කරන ලද වත්මන් හා සංසන්දනාත්මක ඵලදායී ජීවකාලය පහත පරිදි වේ.**

| | |
|---|---|
| ගොඩනැගිලි | වසර 40 යි |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | වසර 13.33 යි |
| මෝටර් හා වෙනත් වාහන | වසර 04 යි |
| ලී බඩු හා සවිකිරීම් | වසර 10 යි |
| කාර්යාලයීය උපකරණ | වසර 10 යි |
| පරිගණක හා උපාංග | වසර 03 යි |

### 3.2 තොගය

තොගය පිරිවැය හා ශුද්ධ උපලබ්ධිත අගය යන අගයන්ගෙන් අවම අගයට ගණනය කර ඇත.

### 3.3 බදුකරණය

#### 3.3.1 ආදායම් බදු

අදාළ වර්ෂයේ සහ පෙර වර්ෂවලට අදාළ ආදායම් බදු බැරකම් හෝ වත්කම් දේශීය ආදායම් කොමසාරිස් වෙත ගෙවීමට හෝ අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

ආදායම් බදු ගණනය කිරීමේදී මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර ඇති දිනට වලංගු බදු ප්‍රතිශතයන් සහ එදිනට නීතිරීති වලට අනුව කටයුතු කරනු ලැබේ. ආදායම් බදු සඳහා වෙන් කිරීමේදී මූල්‍ය ප්‍රකාශනවල සඳහන්ව ඇති ආදායම් සහ වැය ප්‍රභවයන්ට අනුව 2006 වර්ෂයේ දේශීය ආදායම් පනතේ 10 වන ඡේදයට අනුව සහ ඉන් පසුව සිදුකරන ලද සංශෝධනවලට යටත්ව කටයුතු කරනු ඇත.

### 3.4 මුදල් හා මුදල්වලට සමාන දෑ

අත ඇති මුදල්, මාර්ගස්ථ මුදල් සහ බැංකුවේ ඇති මුදල්, මුදල් හා මුදල්වලට සමාන දෑ ලෙස සලකනු ලැබේ.
අරමුදල් ප්‍රධාන ප්‍රකාශනයේදී බැංකු අයිරාව සහ බැංකු ශේෂයට වැඩියෙන් ලබාගත් මුදල් ද මුදල් හා මුදල් වලට සමාන දෑ ලෙස සලකනු ලැබේ.

මුදල් හා මුදල්වලට සමාන දෑ කෙටි කාලීන මුදල් අවශ්‍යතා සහ අනෙකුත් ගනුදෙනු සඳහා අධික ද්‍රවශීලතාවයක් ඇති ලෙස සැලකේ.

## 4. මූල්‍ය උපාංග - මූලික හඳුනාගැනීම් හා ඉදිරි පියවර

### 4.1 මූල්‍ය වත්කම්

#### 4.1.1 වෙළඳ ණය ගැතියෝ

වෙළඳ ණය ගැතියන් සාධාරණ අගයට මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම්කර ඇත.

### 4.2 මූල්‍ය බැඳුම්කර

#### 4.2.1 දේපළ උකස් කිරීම

සංස්ථාවේ සියළු බැංකු පහසුකම් එනම් බැංකු අයිරාව, කෙටිකාලීන ණය, දිගුකාලීන ණය, ණයවර ලිපි හා කාර්ය සාධන බැංකු ඇපකර ලබාගැනීම සඳහා මහජන බැංකුව වෙත අංක MB 979/3063/3243/1147/422/5789 මගින් සංස්ථාවේ දේපල පිරියත හා උපකරණ උකස් කර ඇත.

මීට අමතරව රාජ්‍ය භාණ්ඩාගාර ඇපකරයක් මගින් 2017/09/07 දින අංක TO/REV/TG/522 යටතේ ද පහත ව්‍යාපෘති සඳහන් කරමින් මහජන බැංකු ණය පහසුකම් ලබාගෙන ඇත.

| ව්‍යාපෘතියේ නම | සුරක්ෂිත මුදල (රු.) | කල් ඉකුත්වන දිනය |
|---|---|---|
| බැංකු අයිරා, ණයවර ලිපි හා බැඳුම්කර පහසුකම් සඳහා | මිලියන 165 | 2021. 09. 05 |
| අළුත්වැඩියා සහ ක්‍රියාකාරකම් වර්ධනයට මූල්‍ය වෙන්කිරීම සඳහා | මිලියන 185 | 2023. 09. 15 |

#### 4.2.2 අසම්භාව්‍ය බැරකම් හා ප්‍රාග්ධන බැඳීම්

සියළු ප්‍රමාණාත්මක ප්‍රාග්ධන බැඳීම් හා අසම්භාව්‍ය බැරකම් සලකා බලා ඇති අතර මෙම මූල්‍ය ප්‍රකාශණවල අවශ්‍ය ගැලපුම් හා අනාවරණයක් සිදු කර ඇත.

සංස්ථාව විසින් මුද්‍රණය කරනු ලබන පාසැල් පෙල පොත්, දහම් පාසල් පොත් හා ලොතරැයි මුද්‍රණය හා බෙදා හැරීම සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව සහ ජාතික ලොතරැයි මණ්ඩලය වෙත කාර්යය සාධන බැංකු ඇපකර හා අත්තිකාරම් ගෙවීම් බැඳුම්කර ඉදිරිපත් කර ඇත.

අසම්භාව්‍ය වගකීම් වල මුලු මුදල රු. 145,307,924 ක් වන අතර 2018. 12. 31 දිනට විවෘත කර ඇති ආනයන ණයවර ලිපි වටිනාකම රු. 56,937,201 ක් වේ.

#### 4.3.1 සංචිත

සංස්ථාවේ ආරම්භක ප්‍රාග්ධනය සඳහා පහත පදහන් පරිදි ප්‍රාග්ධන සංචිතය, පොදු සංචිතය හා සංවර්ධන සංචිතය ඇතුලත් වන පරිදි රජයේ ඒකාබද්ධ අරමුදලින් දායකත්වය ලබා දී තිබේ.

| | | |
|---|---|---|
| ප්‍රාග්ධන සංචිත | Rs. | 102,490.50 |
| සංවර්ධන සංචිත | Rs. | 13,901,142.23 |
| පොදු සංචිත | Rs. | 1,000,000.00 |
| | **Rs.** | **15,003,632.73** |

සංස්ථාවේ මුල් ගිණුම් කට්ටලයේ සිට මේ දක්වා මෙම සංචිත මූල්‍ය ප්‍රකාශණ වල දිගටම පැවතුන අතර මෙම සංචිත පවත්වාගෙන යාමේ අරමුණ පැහැදිලි නැත.

### 4.3.2 ප්‍රත්‍යාගණන සංචිතය

මෙම සංචිතයට 2016 වසරේදී මෝටර් රථවාහන නැවත තක්සේරු කිරීමෙන් උපදවන ලද ලාභය හා පහත දක්වෙන පරිදි දේපල උපකරණ හා පිරියත වල නැවත ප්‍රත්‍යාගණනය කිරීමෙන් ජනිත වූ ලාභය ද ඇතුලත් වේ.

| | 2016 (Rs.) | 2017/18 ( Rs.) |
|---|---|---|
| මෝටර් හා වෙනත් වාහන | 36,015,363 | |
| දේපළ | | 377,290,608 |
| ගොඩනැගිලි | | 158,049,568 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | | 246,979,194 |
| කාර්යාලයීය උපකරණ සහ ලීබඩු | | (8,785,874) |
| පරිගණක හා උපාංග | | (1,537,152) |
| | **36,015,363** | **771,996,344** |

## 5. විශ්‍රාම පාරිතෝෂිත වගකීම්

### 5.1 විශ්‍රාම පාරිතෝෂිකය

1983 අංක 12 පාරිතෝෂික දීමනා පනතට අනුව පාරිතෝෂික දීමනාව ගෙවීමට සංස්ථාව බැඳී සිටින අතර මෙතෙක් නියමිත දිනවලට එම දීමනාව ගෙවා ඇති අතර 2018. 12. 31 දිනට පාරිතෝෂික වෙන්කිරීමට අදාළ අරමුදලක් සංස්ථාව විසින් පවත්වාගෙන යනු නොලැබේ.

### 5.2 සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල

සේවක අර්ථසාධක අරමුදලේ හා සේවක භාරකාර අරමුදලේ නීතිරීතිවලට අනුව සංස්ථාව (සේවායෝජක) විසින් සේවාදායකයා වෙත අදාළ අරමුදල් සඳහා බැර කිරීමට බැඳී සිටී. සංස්ථාව විසින් 12% ක් සහ 3%ක් සේවාදායකයාගේ දළ වැටුපට අනුව සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා භාරකාර අරමුදලට පිළිවෙළින් දායකත්වයක් ලබාදෙනු ලැබේ.

## 6. ආදායම් හා වියදම්

### 6.1 ආදායම් හඳුනාගැනීම

උපචිත පදනම මත සියලු ආදායම් හඳුනා ගැනේ.

**පොලී ආදායම**

සංස්ථා සේවකයන්ට ලබා දෙන ණය සඳහා 10% ක පොලියක් අය කරනු ලැබේ.

### 6.2 වියදම් හඳුනාගැනීම

**අයභාර වියදම්**

සංස්ථාවේ පැවැත්මට හා දේපල හා උපකරණ කාර්යක්ෂමව නඩත්තු කිරීමට දරන ලද සියළු වියදම් වර්ෂය තුල ආදායමින් අයකර ඇත.

**ප්‍රාග්ධන වියදම්**

සංස්ථාවේ දේපල හා උපකරණ වල ඉපයීමේ ධාරිතාව වර්ධනය කරගැනීම හා ඉදිරියට ගෙනයාම සඳහා, දේපල අත්පත් කරගැනීම සඳහා දිගු කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා දරන ලද සියළු වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ.

### 6.3 ණයට ගැනුම් පිරිවැය

ණයට ගැනුම් පිරිවැය ඒවා සිදුවූ කාලය තුළ වියදම් ලෙස හඳුනාගැනෙන අතර යන්ත්‍ර හා පිරියත ඒවා ක්‍රියාකාරීත්වයට පත්වන තෙක් දරණ ලද ඊට අදාළ පොලී වියදම ප්‍රාග්ධනගත කර ඇත.

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

# 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශන

| | සටහන | 2018 රු. | නැවත ප්‍රකාශිත ගිණුම් 2017 රු. | 2017 රු. |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 15 | 1,039,094,309 | 1,093,382,089 | 993,178,105 |
| | | **1,039,094,309** | **1,093,382,089** | **993,178,105** |
| **ජංගම වත්කම්** | | | | |
| තොගය | 16 | 438,499,410 | 252,711,676 | 252,711,676 |
| වෙළඳ ලැබීම් | 17 | 299,687,983 | 518,469,708 | 527,327,575 |
| වෙනත් ලැබීම් | 18 | 46,143,558 | 47,308,810 | 47,308,810 |
| පූර්ව ගෙවීම් | | 235,476 | 1,673,445 | 1,673,445 |
| මුදල් හා මුදල්වලට සමාන දෑ | 19 | 29,506,231 | 52,015,886 | 51,857,886 |
| මුළු ජංගම වත්කම් | | **814,072,659** | **872,179,525** | **880,879,392** |
| **මුළු වත්කම්** | | **1,853,166,967** | **1,965,561,613** | **1,874,057,497** |
| **ස්කන්ධය හා බැරකම්** | | | | |
| ප්‍රාග්ධන නිකුතුව | | 15,000,000 | 15,000,000 | 15,000,000 |
| සංචිත | | 15,003,633 | 15,003,633 | 15,003,633 |
| රඳවා ගත් ඉපයීම් | | (446,833,123) | (44,752,462) | (30,931,579) |
| එකතු කලා: ප්‍රත්‍යාගණන ලාභ | | 808,011,707 | 808,012,812 | 701,192,812 |
| **මුළු ස්කන්ධය** | | **391,182,216** | **793,263,983** | **700,264,866** |
| **ජංගම නොවන බැරකම්** | | | | |
| බැංකු ණය - දිගු කාලීන | 20 | 174,000,236 | - | - |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් | | 215,155,555 | 188,712,450 | 188,712,450 |
| විලම්බිත බදු වගකීම් | 21 | (11,566,933) | (11,268,578) | (11,268,578) |
| එකතුව - ජංගම නොවන බැරකම් | | **377,588,858** | **177,443,872** | **177,443,872** |
| **ජංගම බැරකම්** | | | | |
| වෙළඳ ගෙවීම් | 22 | 174,435,807 | 170,035,729 | 171,530,729 |
| වෙනත් ගෙවීම් | 23 | 46,319,872 | 42,641,788 | 42,641,788 |
| කෙටි කාලීන ණය - ණය සඳහා පොළී | 24 | 817,625,781 | 745,962,105 | 745,962,105 |
| බැංකු අයිරා | | 46,014,433 | 36,214,137 | 36,214,137 |
| මුළු ජංගම බැරකම් | | **1,084,395,893** | **994,853,759** | **996,348,759** |
| **මුළු ස්කන්ධය හා බැරකම්** | | **1,853,166,967** | **1,965,561,614** | **1,874,057,497** |

සංස්ථාවේ මෙම මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මූල්‍ය පනතේ අවශ්‍යතාවන්ට අනුකූල බව සහතික කරමු.

.............................
**එන්. ඩී. ප්‍රියංකර කුමාර**
මූල්‍ය කළමනාකරු

මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම් දරයි. ඒවා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇති අතර ඔවුන් වෙනුවෙන් අත්සන් තබා තිබේ. පිටු අංක 15, සහ 16 හි ඇතුළත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 20, 21 මෙන්ම 25 සිට 27 දක්වා ඇතුළත් අදාළ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල වැදගත්ම අංග වේ.

| | | |
|---|---|---|
| ............................. | ............................. | ............................. |
| **එච්. හේවගේ** | **එච්. එම්. මහින්ද පුෂ්පකුමාර** | **රෝහණ චමින්ද රත්නායක** |
| සභාපති/අධ්‍යක්ෂ | ක්‍රියාකාරී අධ්‍යක්ෂ | අධ්‍යක්ෂ |

## 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වයට අදාළ සටහන්

| | | නැවත ප්‍රකාශිත ගිණුම | |
|---|---|---|---|
| | 2018 | 2017 | 2017 |
| | රු. | රු. | රු. |
| **16. තොගය** | | | |
| අමුද්‍රව්‍ය | 203,092,192 | 126,647,717 | 126,647,717 |
| පාරිභෝගික භාණ්ඩ | 10,278,420 | 10,702,665 | 10,702,665 |
| අමතර කොටස් | 37,367,250 | 36,540,074 | 36,540,074 |
| ලෝහ භාණ්ඩ / ගොඩනැගිලි ද්‍රව්‍ය | 1,202,906 | 1,447,563 | 1,447,563 |
| නිමි තොගය | 107,217,687 | 51,557,429 | 51,557,429 |
| නොනිමි තොගය | 79,340,955 | 25,816,228 | 25,816,228 |
| | **438,499,410** | **252,711,676** | **252,711,676** |
| **17. වෙළඳ ලැබීම්** | | | |
| වෙළඳ ණයගැතියෝ | 326,778,134 | 548,474,498 | 557,332,365 |
| බොල් ණය සඳහා වෙන් කිරීම් | (27,451,460) | (23,984,510) | (23,984,510) |
| අ.ප්‍ර.දෙ. තත්ත්ව හානි/දඩ වෙන්කිරීම් | - | (6,381,589) | (6,381,589) |
| වෙනත් ණයගැතියෝ | 361,309 | 361,309 | 361,309 |
| | **299,687,983** | **518,469,708** | **527,327,575** |
| **18. වෙනත් ලැබීම්** | | | |
| සේවක ණය හා අත්තිකාරම් (සටහන 18.1) | 12,969,692 | 19,503,611 | 19,503,611 |
| තැන්පතු හා ලැබීම් (සටහන 18.2) | 14,613,129 | 5,729,546 | 5,729,546 |
| විකුණුම් පාලන ගිණුම | (2,157,001.08) | - | - |
| බැංකු ණය | 12,377,566 | 3,409,883 | 3,409,883 |
| අයකරවා ගතහැකි බදු (ඉ/ගෙ. යෙදවුම් වැට් බදු) | 8,340,172 | 18,665,770 | 18,665,770 |
| | **46,143,558** | **47,308,810** | **47,308,810** |
| **18.1 ණය හා අත්තිකාරම්** | | | |
| ආපදා ණය | 9,788,758 | 15,795,710 | 15,795,710 |
| උත්සව අත්තිකාරම් | 2,378,000 | 2,728,000 | 2,728,000 |
| සේවක වැටුප් අත්තිකාරම් | 6,000 | 31,746 | 31,746 |
| ණය හිමි අත්තිකාරම් ගිණුම | 796,934 | 948,155 | 948,155 |
| | **12,969,692** | **19,503,611** | **19,503,611** |
| **18.2 තැන්පතු හා ලැබීම්** | | | |
| තැන්පතු සඳහා ලැබීම් | 14,099,073 | 5,202,903 | 5,202,903 |
| අමතර වෙනත් ලැබීම් | 514,056 | 526,643 | 526,643 |
| | **14,613,129** | **5,729,546** | **5,729,546** |
| **18.3 විකුණුම් පාලන ගිණුම** | | | |
| විකුණුම් පාලන ගිණුම | (2,157,001) | - | - |
| | (2,157,001) | - | - |
| **19. මුදල් හා මුදල්වලට සමාන දෑ** | | | |
| බැංකුවේ ඇති මුදල් | 27,553,571 | 48,037,960 | 47,879,960 |
| මාර්ගස්ථ මුදල් | 1,893,709 | 3,849,626 | 3,849,626 |
| අතැති මුදල් | 58,950 | 128,300 | 128,300 |
| | **29,506,231** | **52,015,886** | **51,857,886** |

මුදල් ගලා ඒම, මුදල් සහ මුදල් හා සමාන ප්‍රකාශනය සඳහා වන තොරතුරු පහත පරිදි වේ.

| | 2018 | නැවත ප්‍රකාශිත ගිණුම් 2017 | 2017 |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| බැංකුවේ ඇති මුදල් | 27,553,571 | 48,037,960 | 47,879,960 |
| මාර්ගස්ථ මුදල් | 1,893,709 | 3,849,626 | 3,849,626 |
| අතැති මුදල් | 58,950 | 128,300 | 128,300 |
| | **29,506,231** | **52,015,886** | **51,857,886** |
| බැංකු අයිරා | (46,014,433) | (36,214,137) | (36,214,137) |
| | **(16,508,202)** | **15,801,749** | **15,643,749** |
| **20. බැංකු ණය - දිගු කාලීන** | | | |
| 2018. 07. 01 දිනට ආරම්භක ශේෂය | 185,000,000 | - | - |
| වර්ෂය තුල ණය සඳහා ගෙවීම් | (110,999,764) | - | - |
| වර්ෂය අවසානයට ශේෂය | **174,000,236** | - | - |
| **21. විලම්බිත බදු බැරකම්** | | | |
| වර්ෂය ආරම්භක දිනට | (11,268,578) | - | - |
| වර්ෂය තුළ ගැලපුම් | (298,355) | (11,268,578) | (11,268,578) |
| වර්ෂය අවසාන දිනට | **(11,566,933)** | **(11,268,578)** | **(11,268,578)** |
| **22. වෙළඳ ගෙවීම්** | | | |
| වෙළඳ ණය හිමියන් | 42,230,180 | 52,410,998 | 53,905,998 |
| වෙනත් ණය හිමියන් | 1,510,615 | 1,440,310 | 1,440,310 |
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | 129,399,160 | 114,565,198 | 114,565,198 |
| විකුණුම් අත්තිකාරම් | 16,194 | 9,065 | 9,065 |
| වෙනත් ණය හිමියන් (හර ශේෂය) | 1,279,659 | 1,610,158 | 1,610,158 |
| | **174,435,807** | **170,035,729** | **171,530,729** |
| **23. වෙනත් ගෙවීම්** | | | |
| උපචිත වියදම් | 44,848,338 | 41,193,629 | 41,193,629 |
| තැන්පතු ගෙවීම් | 1,471,534 | 1,448,159 | 1,448,159 |
| | **46,319,872** | **42,641,788** | **42,641,788** |
| **24. කෙටි කාලීන ණය** | | | |
| කෙටි කාලීන බැංකු ණය (STL) | 770,860,679 | 697,050,043 | 697,050,043 |
| භාවිතීය ණය | 46,765,102 | 48,912,062 | 48,912,062 |
| | **817,625,781** | **745,962,105** | **745,962,105** |

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

# 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | | නැවත ප්‍රකාශිත ගිණුම් | |
|---|---|---|---|
| | **2018** | **2017** | **2017** |
| | රු. | රු. | රු. |
| **මෙහෙයුම් කටයුතුවලින් ගලා ආ මුදල් ප්‍රවාහය** | **(406,985,154)** | **(243,094,835)** | **(229,273,949)** |
| බදු පෙර ලාභය | | | |
| ගැළපීම්: | | | |
| ස්ථාවර වත්කම් ක්ෂය | 61,107,084 | 45,492,354 | 38,876,337 |
| ජංගම නොවන වත්කම් විකුණුම් ලාභය | - | (1,438,238) | (1,438,238) |
| පෙර වර්ෂයේ ගැළපීම් | - | 3,010,982 | 3,010,982 |
| මූල්‍ය වියදම් | 110,486,874 | 95,754,406 | 95,754,406 |
| පාරිතෝෂික සඳහා වසර තුළ වෙන්කළ ප්‍රතිපාදන | 47,483,284 | 12,861,970 | 12,861,970 |
| අ.ප්‍ර.දෙ. ප්‍රමාද ගාස්තු සඳහා වෙන් කිරීම | - | 6,381,589 | 6,381,589 |
| බොල් ණය සඳහා වෙන් කිරීම | 3,466,949 | (804,035) | (804,035) |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය** | **(184,440,963)** | **(81,835,807)** | **(74,630,938)** |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම** | | | |
| තොගය (වැඩිවීම) / අඩුවීම | (185,787,734) | (29,399,147) | (27,904,147) |
| (වැඩිවීම්)/වෙළඳ ලැබීම් අඩුවීම | 221,696,364 | 151,785,330 | 142,827,463 |
| (වැඩිවීම්)/වෙනත් ලැබීම්වල හා අත්තිකාරම් තැන්පතුවල අඩුවීම | 1,165,252 | 165,380,653 | 165,380,653 |
| ජංගම බැරකම්වල වැඩි/(අඩුවීම) | 8,037,930 | (13,627,719) | (13,527,720) |
| **මෙහෙයුම් කටයුතුවලින් ගලා ආ මුදල් ප්‍රවාහය** | **(139,329,152)** | **192,303,310** | **192,145,310** |
| ගෙවූ බදු | (298,355) | (36,191,121) | (36,191,121) |
| සේවක විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීම | (21,040,179) | (9,346,132) | (9,346,132) |
| **මෙහෙයුම් කටයුතුවලින් ගලා ආ මුදල් ප්‍රවාහය** | **(160,667,686)** | **146,766,057** | **146,608,057** |
| **ආයෝජන කටයුතුවලින් ගලා ආ මුදල් ප්‍රවාහය** | | | |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද මුදල් | - | 1,445,242 | 1,445,242 |
| දේපළ, පිරියත, උපකරණ මිලදී ගැනීම | (6,819,302) | (217,604,067) | (217,604,067) |
| **ආයෝජන කටයුතුවලින් ශුද්ධ මුදල් ගලාඒම** | **(6,819,302)** | **(216,158,825)** | **(216,158,825)** |
| **මූල්‍ය කටයුතුවලින් මුදල් ගලා ඒම** | | | |
| ණයට ගැනුම් සඳහා ගෙවීම් | 245,663,912 | 176,610,759 | 176,610,759 |
| පොලී ගෙවීම | (110,486,874) | (95,754,406) | (95,754,406) |
| **මූල්‍ය කටයුතුවලින් ශුද්ධ මුදල් ගලා ඒම** | **135,177,038** | **80,856,353** | **80,856,353** |
| **ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්) මුදල් හා මුදල්වලට සමාන දෑ** | (32,309,951) | 11,463,585 | 11,305,585 |
| **කාලසීමාව ආරම්භයේ මුදල් හා මුදල්වලට සමාන දෑ** | 15,801,749 | 4,338,164 | 4,338,164 |
| **කාලසීමාව අවසානයේ මුදල් හා මුදල්වලට සමාන දෑ (සටහන 19)** | **(16,508,202)** | **15,801,749** | **15,643,749** |

# 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා හිමිකම වෙනස්වීමේ ප්‍රකාශය

| | ප්‍රාග්ධන නිකුතුව රු. | ප්‍රාග්ධන සංචිතය රු. | පොදු සංචිතය රු. | සංවර්ධන සංචිතය රු. | ප්‍රත්‍යාගණන ලාභය රු. | රඳවාගත් ඉපැයීම් සංචිත රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|---|
| 2017 ගිණුම් | | | | | | | |
| 2017. 01. 01 වැනි දිනට ශේෂය | 15,000,000 | 102,491 | 1,000,000 | 13,901,142 | 36,015,363 | 195,331,388 | **261,350,384** |
| පෙර වර්ෂයේ ගැළපීම් | | | | | | 3,010,982 | **3,010,982** |
| ලාභය/(පාඩුව) වසර සඳහා (බදු පසු) | | | | | | (229,273,949) | **(229,273,949)** |
| ප්‍රත්‍යාගණන ලාභය | | | | | **665,177,449** | | **665,177,449** |
| 2017. 12. 31 දිනට ශේෂය | **15,000,000** | **102,491** | **1,000,000** | **13,901,142** | **701,192,812** | **(30,931,579)** | **700,264,866** |
| නැවත ප්‍රකාශිත ගිණුම් - 2017 | | | | | | | |
| 2017. 01. 01 දිනට ශේෂය | 15,000,000 | 102,491 | 1,000,000 | 13,901,142 | 36,015,363 | 195,331,388 | **261,350,383** |
| පෙර වර්ෂය සඳහා ගැළපීම් | | | | | | 3,010,982 | **3,010,982** |
| ලාභය/(පාඩුව) වසර සඳහා (බදු පසු) | | | | | | (243,094,833) | **(243,094,833)** |
| ප්‍රත්‍යාගණන ලාභය | | | | | 771,997,449 | | **771,997,449** |
| 2017. 12. 31 දිනට ශේෂය | **15,000,000** | **102,491** | **1,000,000** | **13,901,142** | **808,012,812** | **(44,752,462)** | **793,263,982** |
| 2018 ගිණුම් | | | | | | | |
| 2018. 01. 01 දිනට ශේෂය | 15,000,000 | 102,491 | 1,000,000 | 13,901,142 | 808,012,812 | (44,752,462) | **793,263,982** |
| පෙර වර්ෂයේ ගැළපීම් | | | | | | 4,904,493 | **4,904,493** |
| ලාභය/(පාඩුව) වසර සඳහා (බදු පසු) | | | | | | (406,985,154) | **(406,985,154)** |
| ප්‍රත්‍යාගණන ලාභය | | | | | (1,105) | | **(1,105)** |
| 2018. 12. 31 දිනට ශේෂය | **15,000,000** | **102,491** | **1,000,000** | **13,901,142** | **808,011,707** | **(446,833,123)** | **391,182,216** |

## 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශය

| | සටහන් | 2018<br>රු. | නැවත ප්‍රකාශිත ගිණුම<br>2017<br>රු. | 2017<br>රු. |
|---|---|---|---|---|
| ආදායම | 7 | 901,053,747 | 1,240,981,165 | 1,249,839,033 |
| විකුණුම් පිරිවැය | 8 | (903,841,823) | (1,060,576,699) | (1,054,060,200) |
| **දළ ලාභය** | | **(2,788,076)** | **180,404,466** | **195,778,833** |
| වෙනත් මෙහෙයුම් ආදායම | 9 | 17,870,270 | 20,796,639 | 20,796,639 |
| බෙදාහැරීමේ වියදම් | 10 | (16,787,874) | (14,788,906) | (14,788,906) |
| පරිපාලන වියදම් | 11 | (234,414,704) | (213,182,504) | (214,735,986) |
| වෙනත් මෙහෙයුම් සඳහා වියදම් | 12 | (62,818,995) | (122,949,949) | (122,949,949) |
| මෙහෙයුම් ලාභය | | (298,939,379) | (149,720,253) | (135,899,369) |
| මූල්‍ය ආදායම | | 2,441,100 | 2,379,826 | 2,379,826 |
| මූල්‍ය වියදම් | 13 | (110,486,874) | (95,754,406) | (95,754,406) |
| **බදු පෙර ලාභය** | | **(406,985,154)** | **(243,094,833)** | **(229,273,949)** |
| ආදායම් බදු | 14 | - | - | - |
| **බදු පසු ලාභය** | | **(406,985,154)** | **(243,094,833)** | **(229,273,949)** |

## 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශය

| | 2018<br>රු. | නැවත ප්‍රකාශිත ගිණුම<br>2017<br>රු. | 2017<br>රු. |
|---|---|---|---|
| වාර්ෂික ලාභය (බදු පසු) | **(406,985,154)** | **(243,094,833)** | **(229,273,949)** |
| වෙනත් විස්තීරණ ආදායම් | - | - | - |
| ප්‍රත්‍යාගණන ලාභය | (1,105) | 771,997,449 | 665,177,449 |
| වර්ෂය තුළ මුළු විස්තීරණ ආදායම් | **(406,986,259)** | **528,902,616** | **435,903,500** |

# 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

| | | නැවත ප්‍රකාශිත ගිණුම් | |
|---|---|---|---|
| | 2018 | 2017 | 2017 |
| | රු. | රු. | රු. |
| **07. ආදායම්** | | | |
| ලිපිද්‍රව්‍ය කර්මාන්තශාලාවෙන් ලද ආදායම | 221,627,632 | 211,478,267 | 220,336,135 |
| ප්‍රධාන මුද්‍රණාලයෙන් ලද ආදායම | | | |
| පෙළ පොත් | 289,029,668 | 677,043,029 | 677,043,029 |
| ජොබ් වැඩ (වාණිජ මුද්‍රණ කටයුතු) | 360,241,485 | 317,971,906 | 317,971,907 |
| ප්‍රකාශන | 4,786,835 | 2,397,001 | 2,397,001 |
| වෙනත් අලෙවි කටයුතුවලින් ලද ආදායම | 25,368,128 | 32,090,961 | 32,090,961 |
| | **901,053,747** | **1,240,981,165** | **1,249,839,033** |
| **08. විකුණුම් පිරිවැය** | | | |
| **ප්‍රධාන මුද්‍රණාලය** | | | |
| පරිභෝජනය කළ ද්‍රව්‍ය | 407,630,135 | 423,890,328 | 423,890,328 |
| ඍජු ශ්‍රමය | 187,570,249 | 221,253,402 | 221,253,402 |
| ඍජු කර්මාන්තශාලා වියදම් | 36,149,507 | 48,885,456 | 50,380,456 |
| වක්‍ර කර්මාන්තශාලා වියදම් | 91,829,708 | 87,763,170 | 79,751,670 |
| අනෙකුත් වියදම් / තොග ගැලපීම් | (74,060,062) | 36,037,689 | 36,037,689 |
| ප්‍රමාද ගෙවීම් තත්ත්ව හානි හා දඩ (අ. ප්‍ර. දෙ.) | 38,262,345 | 1,958,500 | 1,958,500 |
| ප්‍රමාද ගෙවීම් හා දඩ (ජා.ලො.ම.) | 10,181,000 | - | - |
| අ.ප්‍ර.දෙ. ප්‍රමාද ගාස්තු සඳහා වෙන්කිරීම් | - | 6,381,589 | 6,381,589 |
| | **697,562,880** | **826,170,134** | **819,653,634** |
| **ලිපිද්‍රව්‍ය කර්මාන්තශාලාව** | | | |
| පරිභෝජනය කළ ද්‍රව්‍ය | 129,481,819 | 165,056,830 | 165,056,830 |
| ඍජු ශ්‍රමය | 29,708,956 | 32,853,408 | 32,853,408 |
| ඍජු කර්මාන්තශාලා වියදම් | 3,277,672 | 2,972,534 | 2,972,534 |
| වක්‍ර කර්මාන්තශාලා වියදම් | 8,710,140 | 8,824,840 | 8,824,840 |
| අනෙකුත් වියදම් / තොග ගැලපීම් | 9,533,639 | (7,838,665) | (7,838,664) |
| | **180,712,225** | **201,868,946** | **201,868,948** |
| **ප්‍රකාශන අංශයේ පිරිවැය** | **4,237,183** | **2,992,756** | **2,992,756** |
| **අනෙකුත් අලෙවි අංශවල පිරිවැය** | **21,329,535** | **29,544,862** | **29,544,862** |
| **මුළු විකුණුම් පිරිවැය** | **903,841,823** | **1,060,576,699** | **1,054,060,200** |
| **09. වෙනත් මෙහෙයුම්වලින් ලද ආදායම** | | | |
| මුද්‍රණාලීය අබලි කොළ සහ අනෙකුත් ද්‍රව්‍ය | 17,463,220 | 17,948,931 | 17,948,931 |
| ටෙන්ඩර් තැන්පතු සහ ලියාපදිංචි | 387,850 | 605,435 | 605,435 |
| බොල් ණය සඳහා වෙන්කිරීම් | - | 804,035 | 804,035 |
| ස්ථාවර වත්කම් ඉවත්කිරීමේ ලාභ | - | 1,438,238 | 1,438,238 |
| ආපන ශාලාවෙන් ලද ආදායම | 19,200 | - | - |
| | **17,870,270** | **20,796,639** | **20,796,639** |

| | | නැවත ප්‍රකාශිත ගිණුම් | |
|---|---|---|---|
| | **2018** | **2017** | **2017** |
| | රු. | රු. | රු. |
| 10. බෙදාහැරීම් වියදම් | | | |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 7,364,166 | 8,390,599 | 8,390,599 |
| මෝටර් රථවාහන නඩත්තුව | 5,027,606 | 4,960,616 | 4,960,616 |
| දැන්වීම් සඳහා | 254,648 | 289,626 | 289,626 |
| අලෙවි ප්‍රවර්ධන කටයුතු | 391,585 | 471,083 | 471,083 |
| බොල් ණය සඳහා ප්‍රතිපාදන | 3,466,949.24 | - | - |
| අලෙවිසැල නඩත්තු කිරීමට | 2,350 | 7,200 | 7,200 |
| ගිනි රක්ෂණය - අලෙවිසැල් | 60,007 | - | - |
| ණය එකතු කිරීමේ කොමිස් | - | - | - |
| විකුණුම් කොමිස් | - | 566,491 | 566,491 |
| නිමි තොග ප්‍රවාහය | 10,750 | 103,291 | 103,291 |
| නැවත නොගෙවන ටෙන්ඩර් තැන්පතු | 209,813 | - | - |
| | **16,787,874** | **14,788,906** | **14,788,906** |
| 11. ආයතන හා පරිපාලන වියදම් | | | |
| කුලී | 3,482,711 | 2,907,278 | 2,907,278 |
| ඉඩම් හා ගොඩනැගිලි නඩත්තු | 576,623 | 2,085,568 | 2,085,568 |
| විදුලිය | 178,561 | 266,216 | 266,216 |
| කාර්යාල උපකරණ නඩත්තුව | 395,530 | 1,260,208 | 1,260,208 |
| ක්ෂයවීම් - කාර්යාලයීය උපකරණ | 1,043,964 | 676,348 | 676,348 |
| - ගෘහභාණ්ඩ හා උපාංග | - | - | - |
| - පරිගණක උපාංග | 1,921,470 | 1,715,910 | 3,111,393 |
| - යතුරුපැදි | 64,375 | 66,375 | 66,375 |
| වරිපනම් | 41,487 | 70,008 | 70,008 |
| ජල ගාස්තු | 67,813 | 81,858 | 81,858 |
| වැටුප් හා වේතන | 129,973,241 | 135,659,728 | 135,659,728 |
| අතිකාල දීමනා | 9,824,898 | 11,267,951 | 11,267,951 |
| සේවක අර්ථසාධක අරමුදල | 16,507,035 | 17,393,133 | 17,393,133 |
| සේවක භාරකාර අරමුදල | 4,127,500 | 4,348,285 | 4,348,285 |
| දිරි දීමනා | 2,115,250 | 2,371,000 | 2,371,000 |
| සභාපති වේතනය | 598,771 | 927,374 | 927,374 |
| ක්‍රියාකාරී අධ්‍යක්ෂ වේතනය | 569,869 | 780,000 | 780,000 |
| අධ්‍යක්ෂ ගාස්තු | 453,500 | 374,500 | 374,500 |
| තැපැල් ගාස්තු | 255,824 | 233,567 | 233,567 |
| දුරකථන | 1,580,108 | 1,680,641 | 1,680,641 |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 1,972,015 | 5,047,569 | 5,047,569 |
| පුවත්පත් දැන්වීම් හා ප්‍රකාශන | 504,385 | 806,270 | 806,270 |
| ප්‍රවාහනය හා යැපුම් දීමනා | 1,191,440 | 1,428,331 | 1,428,331 |
| පුවත්පත් හා වාර සඟරා | 270,270 | 101,800 | 101,800 |
| මෝටර් රථවාහන කුලී | - | 4,235 | 4,235 |
| විදේශ සංචාර / සේවක පුහුණුවීම් (විදේශ) | - | 414,993 | 414,993 |
| පොදු කාර්යාලයීය වියදම් | 163,917 | 189,317 | 189,317 |
| විගණන වියදම් | 500,000 | 500,000 | 500,000 |
| විවිධ වියදම් | 45,988 | 52,988 | 52,988 |
| නෛතික හා උපදේශන සේවා | 18,136 | 174,000 | 174,000 |
| වින්දනාත්මක කටයුතු | 377,176 | 515,320 | 515,320 |
| පාරිතෝෂික වියදම් | 47,483,284 | 12,861,970 | 12,861,970 |
| සේවක පුහුණු කිරීම් | 328,000 | 434,300 | 592,300 |
| විගණන හා කළමනාකරණ කමිටු ගාස්තු | 38,250 | 153,000 | 153,000 |
| අන්තර්ජාල / විද්‍යුත් තැපැල | 141,886 | 163,652 | 163,652 |
| ටෙන්ඩර් මණ්ඩල තාක්ෂණික කමිටු වියදම් | 2,190,000 | 704,400 | 704,400 |
| 25% මෝටර් රථවාහන නඩත්තුව | 5,027,606 | 4,960,616 | 4,960,616 |

| | 2018 | නැවත ප්‍රකාශිත ගිණුම් 2017 | 2017 |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| නවාතැන් පහසුකම් | 48,430 | - | - |
| අධ්‍යක්ෂ මණ්ඩල හමු සඳහා වියදම් | 32,984 | 27,372 | 27,372 |
| සාමාජික ගාස්තු | 41,310 | 7,600 | 7,600 |
| පරිත්‍යාග | 46,783 | 254,828 | 254,828 |
| පරිගණක අලුත්වැඩියා හා නඩත්තු ගාස්තු | 144,550 | 167,340 | 167,340 |
| මුදල් ප්‍රවාහන ගාස්තු | - | 9,300 | 9,300 |
| මුදල් පරිවාර වියදම් | - | - | - |
| සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු | 69,768 | 37,357 | 37,357 |
| | **234,414,704** | **213,182,504** | **214,735,986** |
| **12. වෙනත් මෙහෙයුම් වියදම්** | | | |
| සේවක සුභසාධනය | 24,203,913 | 24,880,059 | 24,880,059 |
| සේවක වෛද්‍ය පහසුකම් | 10,046,219 | 10,612,238 | 10,612,238 |
| නිවාස ණය පොලී | 2,573,035 | 3,113,525 | 3,113,525 |
| කාර්ය මණ්ඩලය සඳහා ප්‍රසාද දීමනා | 1,408,369 | 50,190,854 | 50,190,854 |
| විශේෂ දිරි දීමනා | - | 7,490,000 | 7,490,000 |
| කාර්ය මණ්ඩල ප්‍රවාහනය | 10,879,168 | 11,012,114 | 11,012,114 |
| නිවාඩු සඳහා ගෙවීම් | 13,615,290 | 15,607,159 | 15,607,159 |
| කාර්ය මණ්ඩල සම්මාන | 93,000 | 44,000 | 44,000 |
| උපයන විට ගෙවීම් බදු | - | - | - |
| | **62,818,995** | **122,949,949** | **122,949,949** |
| **13. මූල්‍ය වියදම්** | | | |
| බැංකු ගාස්තු හා බැංකු ඇපකර ගාස්තු | 2,349,948 | 7,276,412 | 7,276,412 |
| බැංකු අයිරා පොලී | 5,347,406 | 6,462,707 | 6,462,707 |
| බැංකු ණය පොලී - කෙටි කාලීන | 88,917,227 | 82,015,287 | 82,015,287 |
| බැංකු ණය පොලී - දිගු කාලීන | 13,872,293 | - | - |
| | **110,486,874** | **95,754,406** | **95,754,406** |
| **14. ආදායම් බදු** | | | |
| වසර සඳහා ආදායම් බදු ප්‍රතිපාදන | - | - | - |
| | - | - | - |

# 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

**15.** දේපළ, පිරියත සහ උපකරණ

| විස්තරය | 2016.12.31 දිනට | ප්‍රත්‍යාගණනය 01. 01. 2017 | වර්ෂය තුළ එකතුවීම් හා ප්‍රත්‍යාගණනය | වර්ෂය තුළ ඉවත් කිරීම් | ප්‍රත්‍යාගණන/ පිරිවැය 31. 12. 2017 | වර්ෂය තුළ ඉවත් කිරීම් | පිරිවැය/ ප්‍රත්‍යාගණනය 01.01.2018 | වර්ෂය තුළ එකතුවීම් 2018 | 2018. 12. 31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|---|
| පිරිවැයට | | | | | | | | | |
| ඉඩම් | 475,126 | 378,500,000 | | - | 378,500,000 | - | 378,500,000 | - | 378,500,000 |
| ගොඩනැගිලි | 38,020,440 | 166,600,000 | | - | 166,600,000 | - | 166,600,000 | - | 166,600,000 |
| * පිරියත හා යන්ත්‍රෝපකරණ | 243,785,462 | 317,487,100 | 212,640,604 | - | 530,127,704 | - | 530,127,704 | 5,229,372 | 535,357,077 |
| * කර්මාන්ත උපාංග හා වර්ග | 2,368,661 | - | - | - | - | - | - | - | 0 |
| මෝටර් හා වෙනත් වාහන | 55,571,000 | - | - | (8,000) | 55,563,000 | - | 55,563,000 | - | 55,563,000 |
| ** කාර්යාලයීය උපකරණ | 35,577,032 | 5,879,200 | 3,449,693 | - | 9,328,893.26 | - | 9,328,893 | 1,504,940 | 10,833,834 |
| ** ලී බඩු හා සවිකිරීම් | 4,476,547 | - | - | - | - | - | - | - | 0 |
| පරිගණක හා උපාංග | 40,307,456 | 4,186,450 | 1,513,770 | - | 5,700,220 | - | 5,700,220 | 84,990 | 5,785,210 |
| ඉලෙක්ට්‍රොනික ප්‍රතිස්ථාපන | 2,572,951 | - | - | - | 2,572,951 | - | 2,572,951 | - | 2,572,951 |
| **එකතුව** | **397,197,548** | **872,652,750** | **217,604,068** | **(8,000)** | **1,148,392,769** | **-** | **1,148,392,769** | **6,819,302** | **1,155,212,071** |
| **සමුච්චිත ක්ෂය වීම්** | | | | | | | | | |
| විස්තරය | **As at 31.12.16** | **Revaluations/C for the year 01. 01. 2017** | **Annual Depreciation 2017** | **Disposals during the year** | **Accumulated Depreciation 31.12.2017** | **Disposals during the year** | **Revaluations/ Cost 01.01.2018** | **Annual Depreciation 2018** | **Accumulated Depreciation 31.12.2018** |
| ගොඩනැගිලි | 29,794,308 | - | 4,165,000 | - | 4,165,000 | - | 4,165,000 | 4,165,000 | 8,330,000 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 174,372,938 | - | 17,030,847 | - | 25,042,347 | - | 25,042,347 | 40,085,900 | 65,128,247 |
| ( +)Correcrion -Restated Ac 2017 | | | **8,011,500** | | | | | | |
| කර්මාන්ත උපාංග වර්ග | 2,059,324 | - | - | - | - | - | - | - | 0 |
| ලී බඩු හා සවිකිරීම් | 4,011,099 | - | - | - | - | - | - | - | 0 |
| මෝටර් හා වෙනත් වාහන | 6,946,374 | 6,946,374 | 13,890,750 | 1,000 | 20,838,125 | - | 20,838,125 | 13,890,750 | 34,728,875 |
| කාර්යාලයීය උපකරණ | 21,407,065 | - | 676,348 | - | 676,348 | - | 676,348 | 1,043,964 | 1,720,312 |
| පරිගණක හා උපාංග | 34,613,513 | - | 3,111,393 | - | 1,715,910 | - | 1,715,910 | 1,921,470 | 3,637,380 |
| ( - )Correcrion -Restated Ac 2017 | | | **(1,395,483)** | | | | | | |
| ඉලෙක්ට්‍රොනික ප්‍රතිස්ථාපන | 2,572,950 | 2,572,950 | - | - | 2,572,950 | - | 2,572,950 | - | 2,572,950 |
| **එකතුව** | **297,517,582** | | **45,490,355** | **1,000** | **55,010,679** | **-** | **55,010,679** | **61,107,084** | **116,117,763** |
| **ලියා හල අගය** | **99,679,966** | | | | **1,093,382,090** | | | | **1,039,094,309** |

* / ** revalued under one category during the year

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එම්ආර්ඩී/ඩී/එස්පීසී/ 1 /18/127 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2019 මැයි 31 දින

සභාපති
රාජ්‍ය මුද්‍රණ සංස්ථාව

**රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් සහ සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රසිද්ධ කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ප්‍රමාණාත්මක ගිණුම්කරණ දෝෂ

(i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 32,987,997 ක් වූ මුදල් හා බැංකු ශේෂවලට තවත් ගිණුමක වූ රු. 5,434,426 ක අයිරා ශේෂය හිලව් කර ශුද්ධ ශේෂය වන රු. 27,553,571 පමණක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මුදල් හා මුදල් සමාන දෑ යටතේ දැක්වීම නිසා බැංකු අයිරාව හා මුදල් හා මුදල් සමාන දෑ රු. 5,434,426 ක් අඩුවෙන් හෙළිදරව් කර තිබුණි.

(ii) පසුගිය වර්ෂයේ රු. 91,924,671ක් වටිනා අවසාන අමුද්‍රව්‍ය තොගය සමාලෝචිත වර්ෂයේදී සදොස් ලෙස රු. 93,911,088 ලෙස ඉදිරියට ගෙන ඒම නිසා රු. 1,986,418 කින් සමාලෝචිත වර්ෂයේ ශුද්ධ අලාභය වැඩියෙන් දක්වා තිබුණි.

(iii) පසුගිය වර්ෂයේ රු. 34,351,421 ක් වටිනා අවසාන අමතර කොටස් තොගය සමාලෝචිත වර්ෂයේදී සදොස් ලෙස රු. 32,856,421 ක් ලෙස ඉදිරියට ගෙන ඒම නිසා සමාලෝචිත වර්ෂයේ ශුද්ධ අලාභය රු. 1,495,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ගිණුම්කරණ ප්‍රමිත වලින් බැහැර වීම
------------------------------------------

(i) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

ප්‍රමිතියෙහි 79 (ආ) ඡේදය ප්‍රකාරව ප්‍රාග්ධනය තුළ ඇතුළත් සංචිතයන්ගේ ස්වභාවය, පවත්වාගෙන යාමේ අරමුණ ආදිය පිළිබඳව හෙළිදරව් කිරීම අවශ්‍ය වුවද සංස්ථාව විසින් පවත්වාගෙන යනු ලබන රු. 102,491 ක් වූ ප්‍රාග්ධන සංචිතය, රු 1,000,000 ක් වූ පොදු සංචිතය, රු. 13,901,142 ක් වූ සංවර්ධන සංචිතය හා රු. 808,011,707 ක ප්‍රත්‍යාගණන සංචිත පිළිබඳව හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි.

(ii) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07

- සමාලෝචිත වර්ෂයේ මුදල් හා මුදල් සමාන දෑ හි ආරම්භක ශේෂය රු. 15,643,749 ක් වුවද එය රු. 15,801,749 ක් ලෙස යොදා මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළනය කර තිබුණි.
- සමාලෝචිත වර්ෂයේ ජංගම වගකීම් හි වැඩිවීම රු. 8,078,063 ක් වූ නමුදු මුදල් ප්‍රවාහ ප්‍රකාශයේදි රු. 40,133 ක් අඩුවෙන් එම වැඩිවීම හඳුනාගෙන තිබුණි.

(iii) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 23

සමාලෝචිත වර්ෂයේදී මිලදී ගන්නා ලද ලොතරැයි මුද්‍රණ යන්ත්‍රය වෙනුවෙන් ලබාගත් ණය මුදල සඳහා ගෙවන ලද පොලිය හඳුනාගෙන ප්‍රමිතියේ 09 ඡේදයේ පරිදි ප්‍රාග්ධනිත කළ යුතු වුවද එසේ ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) නොසැසඳූ ශේෂ
-------------------

(i) රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ සනාථ කිරීම් අනුව එම දෙපාර්තමේන්තුවට රු. 8,325,817 ක් අයවීමට ඇති බව දන්වා තිබුණද රු. 4,012,020 ක මුදලක් පමණක් එම දෙපාර්තමේන්තුවට ගෙවීමට ඇති බව සංස්ථා ගිණුම්වල දක්වා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ශේෂ සනාථ කිරීම් අනුව එම දෙපාර්තමේන්තුව විසින් ගෙවීමට කිසිදු ණය ශේෂයක් නොමැති වුවද එම දෙපාර්තමේන්තුව විසින් සංස්ථාව වෙත රු. 11,836,011 ක මුදලක් ගෙවීමට ඇති බවට සංස්ථාවේ ගිණුම්වල දක්වා තිබුණි.

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

(i) වර්ෂ 06 ක් හා ඊට වැඩි එකතුව රු. 110,854,132 ක් වූ වෙළඳ ණයගැති ශේෂයක් අයකර ගැනීමට සංස්ථාව අපොහොසත් වී තිබුණු අතර එය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණයගැති ශේෂය වූ රු. 326,777,812 කින් සියයට 34 ක් විය.

(ii) සමාලෝචිත වර්ෂය අවසානයට ජාතික කඩදාසි සමාගමෙන් සංස්ථාව වෙත රු. 9,753,427 ක් අයවීමට තිබූ අතර සංස්ථාව විසින් කඩදාසි සමාගමට ගෙවිය යුතු මුදල රු. 7,460,675 ක් වී තිබුණි. මෙම ශේෂ තුළ අවුරුදු 05 ඉක්මවූ ණය මුදල පිළිවෙලින් රු. 7,989,976 ක් සහ රු. 5,578,142 ක්වූ නමුත් මෙම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. කඩදාසි සමාගමේ ව්‍යාපාර කටයුතු නතරවීම නිසා මෙම ශේෂ නිරවුල් කිරීම පිළිබඳ අවිනිශ්චිතතාවයක් නිරීක්ෂණය කෙරේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමණාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමණාකරණයේ වගකීමක් වන අතර, කළමණාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමණාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වන්නා වූ අවදානම් මගහරවා ගැනීමට ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළයුතු අතර , එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් නොමැති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 2015 මැයි 25 දිනැති අංක PED 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය 4.2 වගන්තිය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සංස්ථාවේ මධ්‍ය මට්ටමේ කළමණාකරුවන් 15 දෙනෙකු සඳහා කණ්ඩායම් ප්‍රවාහන සේවය සැපයීමට කටයුතු නොකර ඒ වෙනුවට එක් අයෙකුට මාසිකව රු. 17,500 බැගින් සමාලෝචිත වර්ෂයේ රු. 3,150,000 ක දීමනා ගෙවා තිබුණි. |
| (ආ)1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥා පනතේ 41 වගන්තිය | ගිනි අනතුරු ඇඟවීමේ සංඥා පද්ධතියක් ස්ථාපිත කර නොතිබුණි. |

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

## 3. අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) ලොතරැයි මණ්ඩලය සමග ඇති කරගත් ගිවිසුම ප්‍රකාරව ලොතරැයි මුද්‍රණය කර නියමිත දිනට භාර නොදීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලොතරැයි මණ්ඩලය විසින් ගෙවිය යුතු මුදලින් රු 10,181,000 ක් දඩ වශයෙන් අඩු කර ගෙන තිබුණි.

(ආ) 2019 වර්ෂය සඳහා පාසල් පෙළපොත් මුද්‍රණය කර භාර දීම සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව සමඟ ඇති කරගත් ගිවිසුම ප්‍රකාරව දින 01 සිට දින 26 දක්වා කාල ප්‍රමාදයකින් මුද්‍රණය කරන ලද පාසල් පොත් භාර දීම හේතුවෙන් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සංස්ථාවට ගෙවිය යුතු මුදලින් රු. 38,262,345 ක් ප්‍රමාද ගාස්තු වශයෙන් අය කර ගෙන තිබුණි.

(ඇ) සංස්ථාව සතු පාදුක්ක පානළුවේ පිහිටි ඉඩමෙන් තක්සේරු වටිනාකම රු. 107,000,000 ක් වූ අක්කර 13 රූඩ් 02 පර්චස් 06 ක ප්‍රමාණයක කර්මාන්ත පුරයක් ඇති කිරීම සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලයට පවරා දීමට හෝ ආපසු ලබා ගැනීම පිළිබඳව නිශ්චිත තීරණයකට එළඹීමට සංස්ථාව ක්‍රියාකර නොතිබුණි.

(ඈ) රු. 203,509,234 ක් වැය කර මිලදී ගත් ලොතරැයි මුද්‍රණ යන්ත්‍රයට අදාළ මුරපද (password) යන්ත්‍ර නිෂ්පාදන ආයතනයෙන් ලබා ගැනීමට සංස්ථාව කටයුතු කර නොතිබීම නිසා යන්ත්‍රයට මෘදුකාංග ඇතුළත් කිරීමේදී නිෂ්පාදක ඉන්දියානු සමාගම මත කටයුතු කිරීමට සිදු වී තිබුණි. තවද යන්ත්‍රයේ වගකීම් කාලය සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් 20 දින අවසන් වී තිබූ නමුදු සංස්ථාව නිෂ්පාදකගේ දේශීය නියෝජිතයා සමඟ වාර්ෂික නඩත්තු ගිවිසුමකට එළඹී නොතිබුණි.

(ඉ) ලොතරැයි මුද්‍රණ යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය සඳහා වාර්ෂික Flexo ටේප් රෝල් අවශ්‍යතාවය රෝල් 5ක් වු මුත් එය නොසලකා රු. 3,115,200 ක් වැය කර 2017 වර්ෂයේදී ටේප් රෝල් 66 ක් මිලදී ගෙන තිබුණි. එයින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට එකතු වටිනාකම රු. 2,879,200 ක් වු ටේප් රෝල් 61 ක් ගබඩාවේ ඉතිරිව තිබූ අතර ඒවා කල් ඉකුත් වී තිබුණි.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

**1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ප්‍රමාණාත්මක ගිණුම්කරණ දෝෂ**

i. 2019 ගිණුම් වර්ෂයේදී මෙය සැලකිල්ලට ගෙන නිවැරදිව ඉදිරිපත් කරනු ලැබේ.

ii. එළඹෙන ගිණුම් වර්ෂයේ නිවැරදි කිරීම් සිදුකර ඉදිරිපත් කරනු ලැබේ

iii. අවශ්‍ය නිවැරදි කිරීම් 2019 වර්ෂයේදී සිදු කරනු ලැබේ.

**(ආ) ගිණුම්කරණ ප්‍රමිතවලින් බැහැර වීම**

(i) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01**

සංස්ථාව ආරම්භක අවස්ථාවේදී ප්‍රාග්ධන සංචිතය පිහිටුවා ඇති අතර අවසන් ගිණුම්වල මෙය ප්‍රමාණවත් පරිදි සටහනක් ලෙස සටහන් අංක 4.3.1 හි සහ ප්‍රත්‍යාගණන සංචිතය පිළිබඳ සටහන් අංක 4.3.2 හි ද සඳහන් කර ඇත.

(ii) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07**

පසුගිය වර්ෂයේ සේවක පුහුණුව සඳහා රු. 158,000/- ක මුදලක් ගෙවා ඇතත් එම ගෙවීම නිත්‍යානුකූල නොවීම හේතුවෙන් නැවත එම සේවකයින්ගෙන් අයකර ගැනීමට කටයුතු කර ඇත. මෙය පසුගිය වර්ෂයට අදාළ ගනුදෙනුවක් බැවින් 2017 වසර සඳහා නැවත සැකසූ ගිණුම්වලට ගළපා ඇත.

ඉදිරි ගිණුම් වර්ෂයේදී සියලු වගකීම් නිවැරදිව හඳුනාගෙන ඉදිරිපත් කරනු ලැබේ.

(iii) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 23**

2018 වර්ෂයේ මුල් කාර්තුවේදී යන්ත්‍රය භාවිතයට යෙදවූ බැවින් එතෙක් දරන ලද පොලී වියදම් ප්‍රාග්ධනිත කර ඇත.

**(ඇ) නොසැසඳූ ශේෂ**

(i) ඉදිරියේදී මෙය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(ii) මෙම ශේෂය සංස්ථා ගිණුම් අනුව තවදුරටත් ලැබිය යුතු මුදල් ලෙස සටහන්ව ඇති අතර ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් විධිමත් පරිදි නොගෙවීම තහවුරු කර නැත. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවෙන් මේ පිළිබඳව ලිඛිත විමසීමක් කිරීමෙන් අනතුරුව වාර්තාවක් ලබාගෙන එය අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර එහි උපදෙස් අනුව අවශ්‍ය කටයුතු කිරීමට පියවර ගනිමින් පවතී.

**(ඈ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(i) වර්තමානයේදී ණය අයකර ගැනීම ප්‍රගතියක් පෙන්නුම් කරන අතර පැරණි ණය අයකර ගැනීමේ කටයුතු නීති අංශය, විගණන අංශය, මුදල් අංශය හා අලෙවි අංශය එක්ව ක්‍රියා කරනු ලබයි.

(ii) සංස්ථාව වෙත ලබාගත යුතු මුදල් ලබා ගැනීම සඳහා ජාතික කඩදාසි සංස්ථාවේ නිසි බලධරයා වෙත නැවත සිහි කැඳවීම් කිරීමට කටයුතු කරනු ලැබේ.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

### නීතිරීති රෙගුලාසිවලට යොමුව

(අ) ද්‍රවශීලතාවය යහපත් අතට හැරුන විගස ප්‍රමාණාත්මක වාහන සංඛ්‍යාවක් යොදවාගෙන මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් වෙත චක්‍රලේඛයට අනුකූලව ප්‍රවාහන පහසුකම් සැපයීමට කටයුතු කරනු ලැබේ.

(ආ) ගිනි අනතුරු හැඟවීමේ සංඥා පද්ධතියක් සවි කිරීමට ක්‍රියා කළද එය හොඳ තත්ත්වයෙන් නොමැති නිසා නැවත පද්ධතියක් සවි කිරීමට ක්‍රියා කරනු ලැබේ.

## 3. අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) ලොතරැයි මුද්‍රණ යන්ත්‍රය නිතර නිතර ආපදාවට ලක්වීමත් සංස්ථාවේ පවතින මූල්‍ය දුෂ්කරතාවය හේතුවෙන් ලොතරැයි මුද්‍රණයට අවශ්‍ය අමුද්‍රව්‍ය නියමිත පරිදි නොලැබීමත් මෙයට හේතු වී ඇත.

(ආ) එවකට රටේ ඇති වූ දේශපාලන අස්ථාවරත්වය හේතුවෙන් එදින සිට මාස 4ක් වැනි කාලයක් සංස්ථාවේ සභාපතිවරයෙකු හෝ අධ්‍යක්ෂ මණ්ඩලයක් නොමැතිවීම මත ප්‍රසම්පාදන කමිටුවක් නොමැති වීමෙන් පෙළ පොත් සඳහා අවශ්‍ය කඩදාසි ආනයනය හා වෙනත් අමුද්‍රව්‍ය ආනයනය කිරීමේ ගැටලු රාශියක් පැන නැගුණි. එමෙන්ම සංස්ථාවේ පවතින මූල්‍ය දුෂ්කරතාවය මෙයට බලපෑ අතර මෙම කරුණු මත පෙළ පොත් සඳහා ප්‍රමාද ගාස්තු ගෙවීමට සිදුවිය.

(ඇ) කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් අනුව මිලියන 25 කට මෙම ඉඩම මිලදී ගැනීමට කටයුතු කරමින් පවතින අතර රජයේ තක්සේරු වටිනාකම වූ රු. මිලියන 107 කට විකිණීම සඳහා මේ වන විට අමාත්‍ය මණ්ඩල සංදේශයක් අප සංස්ථාව විසින් ඉදිරිපත් කර ඇත. ඉදිරියේදී එහි තීරණ අනුව කටයුතු කරනු ලැබේ.

(ඈ) අප අමාත්‍යාංශය නියෝජිත ආයතනය සමඟ සම්බන්ධීකරණය කරමින් මෙය සිදු කිරීමට මේ වන විට සාකච්ඡා කරනු ලබන අතර එහි තීරණ අනුව කටයුතු කරනු ලැබේ.

(ඉ) අදාළ අයිතමය සම්බන්ධයෙන් මූලික ප්‍රායෝගික දැනුමක් නොමැති නිසා එය ඇණවුම්කර තිබූ අතර ඉදිරියේදී එය ප්‍රයෝජනයට ගැනීමට නියමිතය.